# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. RG/NB/01/චක්‍රලේඛ

ප්‍රධාන කාර්යාලය / தலைமை அலுவலகம் / HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

ඔබේ අංකය / உமது இல. / Your No.

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date 2021.03.31


චක්‍රලේඛ අංක 07/2021

සියලුම කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්/ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්

සියලුම දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් සහ

සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

**<u>2019 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම</u>**

සියලුම රාජ්‍ය ආයතන විසින් විවිධ සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු සංශෝධනය කරන ලෙස භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2018 (i) දරන 2019.06.13 දිනැති චක්‍රලේඛයෙන් දන්වා ඇත. ඒ අනුව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් මහජන සේවාවන් සැපයීමේදී අය කරනු ලබන ගාස්තු සංශෝධනය කිරීමට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලමින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අංක 21/0364/303/022 සහ 2021.02.23 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා අනුමැතිය ලැබී ඇත.

02. මෙම දෙපාර්තමේන්තුව විසින් ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත, ඇටෝර්නි බලපත්‍ර ආඥා පනත, නොතාරිස් ආඥා පනත සහ බද්ධ නිවාස අයිතිකම් පනත යටතේ මහජනතාව වෙත සපයනු ලබන සේවාවන් සඳහා අය කිරීමට නියමිත සංශෝධිත ගාස්තු ප්‍රමාණයන් පහත දැක්වේ. මෙම සංශෝධිත ගාස්තු අය කිරීම 2021.04.01 දින සිට ක්‍රියාත්මක වන අතර ගාස්තු මුදලින් අය කර ගැනීමට පියවර ගත යුතුය.

<u>ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ ගාස්තු</u>

**01.** <u>ලියාපදිංචි කිරීමේ ගාස්තු</u>

| | කාරණය | වර්තමාන ගාස්තුව (රු.) | සංශෝධිත ගාස්තුව (රු.) |
|---|---|---|---|
| 1. | දැනට අයකරනු ලබන ලියාපදිංචි කිරීමේ ගාස්තුවට අමතරව ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතට අනුව ලියාපදිංචි කිරීම සඳහා භාර ගනු ලබන සෑම ලියවිල්ලක් සඳහාම | 100.00 | 120.00 |
| 2. | ලියාපදිංචි කිරීමේ දිස්ත්‍රික්ක එකකට හෝ වැඩි ගණනකට අදාළ ඔප්පුවක් ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ඉදිරිපත් කිරීම | 1000.00 | 1200.00 |




දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. 2889488, 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.rgd.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail rgd@sltnet.lk, rg@rgd.gov.lk

**02.** පරීක්ෂා කිරීමේ සහ උධෘත පිටපත් නිකුත් කිරීමේ ගාස්තු

| | කාරණය | වර්තමාන ගාස්තුව (රු.) | සංශෝධිත ගාස්තුව (රු.) |
|---|---|---|---|
| 1. | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඉඩම් ලේඛනයක්, සූචියක් හෝ වෙනත් ලේඛනයක් පරීක්ෂා කිරීම - එක් ඉඩමකට අදාළව, | 500.00 | 600.00 |
| 2. | ඉඩම් ලේඛන උධෘත නිකුත් කිරීම - එක් ඉඩමකට අදාළව | 100.00 | 120.00 |
| 3. | ඔප්පුවක සහතික පිටපතක් නිකුත් කිරීම | 500.00 | 600.00 |

**03.** ඇටෝර්නි බලපත්‍ර ආඥා පනත යටතේ ගාස්තු

| | කාරණය | වර්තමාන ගාස්තුව (රු.) | සංශෝධිත ගාස්තුව (රු.) |
|---|---|---|---|
| 1. | ඇටෝර්නි බලපත්‍රයක් ලියාපදිංචි කිරීම | 1500.00 | 1750.00 |
| 2. | ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම | 1500.00 | 1750.00 |
| 3. | ඇටෝර්නි බලපත්‍ර හෝ ලියාපදිංචි කිරීමේ සටහන් පරීක්ෂා කිරීම | 500.00 | 600.00 |
| 4. | ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රයක සහතික කළ පිටපතක් නිකුත් කිරීම | 500.00 | 600.00 |
| 5. | ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රයක සහතික කරන ලද උධෘත පිටපතක් නිකුත් කිරීම | 500.00 | 600.00 |

04. <u>නොතාරිස් ආඥා පනත යටතේ ගාස්තු</u>

| | කාරණය | වර්තමාන ගාස්තුව (රු.) | සංශෝධිත ගාස්තුව (රු.) |
|---|---|---|---|
| 1. | නොතාරිස්වරයෙකු වශයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රථමවරට බලපත්‍රයක් නිකුත් කිරීම | 2000.00 | 3000.00 |
| 2. | නොතාරිස්වරයෙකුට අතිරේක භාෂාවකින් කටයුතු කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම | 2000.00 | 3000.00 |
| 3. | නොතාරිස්වරයෙකුට සිය අධිකරණ කලාපය මාරු කිරීම සඳහා (එක් භාෂාවකට) | 2000.00 | 3000.00 |
| 4. | නොතාරිස්වරයෙකුට වාර්ෂික මහාධිකරණ සහතිකය ලබා ගැනීම සඳහා | 2000.00 | 3000.00 |

05. <u>බද්ධ නිවාස ලියාපදිංචි කිරීමේ පනත යටතේ ගාස්තු</u>

| | කාරණය | වර්තමාන ගාස්තුව (රු.) | සංශෝධිත ගාස්තුව (රු.) |
|---|---|---|---|
| 1. | සභාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීම | 100.00 | එක් ඒකකයක් සඳහා රු. 150.00 බැගින් |
| 2. | සභාධිපත්‍ය ඉඩම් ඔප්පුවක සහතික පිටපත් නිකුත් කිරීම (සාමාන්‍ය ක්‍රමවේදය යටතේ ඒකක 1 සිට 5 දක්වා) | 500.00 | 600.00 |
| 3. | සභාධිපත්‍ය ඉඩම් ඔප්පුවක සහතික පිටපත් නිකුත් කිරීම (සාමාන්‍ය ක්‍රමවේදය යටතේ ඒකක 6 සිට වැඩිවන සෑම ඒකකයක් සඳහා) | - | 100.00 |
| 4. | සභාධිපත්‍ය ඉඩම් ඔප්පුවක සහතික පිටපත් නිකුත් කිරීම (එක්දින සේවා සැපයීම් ක්‍රමවේදය යටතේ ඒකක 1 සිට 5 දක්වා) | - | 1000.00 |

| | | | |
|---|---|---|---|
| 5. | සභාධිපත්‍ය ඉඩම් ඔප්පුවක සහතික පිටපත් නිකුත් කිරීම (එක්දින සේවා සැපයීම් ක්‍රමවේදය යටතේ ඒකක 6 සිට වැඩිවන සෑම ඒකකයක් සඳහා) | - | 200.00 |
| 6. | සභාධිපත්‍ය ඉඩම් ලේඛන උධෘත පිටපත් නිකුත් කිරීම (සාමාන්‍ය ක්‍රමවේදය යටතේ එක් පත්ඉරුවක් සඳහා) | 100.00 | 200.00 |
| 7. | සභාධිපත්‍ය ඉඩම් ලේඛන උධෘත පිටපත් නිකුත් කිරීම (එක්දින සේවා සැපයීම් ක්‍රමවේදය යටතේ එක් පත්ඉරුවක් සඳහා | 200.00 | 500.00 |

ඩබ්ලිව්.එම්.එම්.බී. වීරසේකර

රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් : 01. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් -
02. ලේකම්, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය -
03. විගණකාධිපති -
04. ප්‍රධාන ගණකාධිකාරී -
05. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් -
06. ගරු අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් -

(01–06: කාරුණික දැන ගැනීම සඳහා)